දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) DGHS/COVID/347/2021
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 15 .07.2021

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

---

## සංචරණ සීමා ලිහිල් කිරීම

1. දැනට පවතින සංචරණ සීමාවන් ලිහිල් කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් ද 2021 ජූලි 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇතුලත් කරණු ලැබේ.
2. වසංගත රෝග තත්වයන්හි වෙනස්වීම් මත පදනම්ව ලිහිල් කරන ලද සංචරණ සීමා සංශෝධනයට ලක් විය හැකිය.
3. අවසර ලබා දී ඇති කාර්යයන් සඳහා නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට තදින් අනුකූල වන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලබයි.
4. සියළුම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල ක්‍රියාකාරිත්වය නව සාමාන්‍යභාවයට අනුකූල වන ලෙස පවත්වා ගෙන යාමට වග බලාගත යුතුය.
5. සියලුම ආයතන, අංශ හා මහජනතාව DReAM (D පුද්ගල දුරස්ථභාවය, සමූහ ලෙස රැස් නොවී සිටීම, නිවසටම වී සිටීම, Re - ශ්වසන චර්යා විදි පවත්වා ගෙන යාම, A - විෂබීජහරණ පිළිවෙත් : නිවැරදිව දෑත් සේදීම, විෂබීජහරණය කිරීම, M - නිවැරදිව මුහුණු ආවරණ පැලදීම ) ලෙස හදුන්වා දී ඇති පූර්වාරක්ෂක ක්‍රමවේද සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ තරයේ පිළිපදිමින් කටයුතු කළ යුතුය.

| අනු අංකය | ක්‍රියාකාරකම් | සීමා ලිහිල් කිරීම |
|---|---|---|
| 1 | ආගමික ස්ථාන සහ ආගමික උත්සව (පන්සල්, ක්‍රිස්තියානි පල්ලි, ඉස්ලාමීය පල්ලි, කෝවිල්) | ආගමික ස්ථාන විවෘතයි.<br>ආගමික උත්සව සඳහා වන සෞඛ්‍ය මාර්ගෝපදේශයන් වෙන වෙනම නිකුත් කරණු ලැබේ. |
| 2 | සත්ව උද්‍යාන | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව වරකට ඇතුලත් කරගත හැකි පුද්ගල ධාරිතාවයෙන් 25% |

| | | |
|---|---|---|
| 3 | වන ජීවී උද්‍යාන | විවෘතයි.<br>වන ජීවීන් නැරඹීමට යොදා ගන්නා වාහනයන්හි (Safari Vehicles) රියදුරු කොටස මගීන් ගමන් කරනු ලබන කොටසින් වෙන්ව තිබිය යුතුයි. රථයේ රියදුරු සහ මඟපෙන්වන්නන් ආරක්ෂිත ඇඳුම් පැළඳ සිටිය යුතුයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව වේ. |
| 4 | ක්‍රීඩා තරඟ/කණ්ඩායම් ක්‍රීඩා | කොවිඩ් 19 රෝගය පැතිරීමට හේතුවන භෞතිකව සම්බන්ධ වන (Physical Contact) ක්‍රීඩා හැර අනෙකුත් ක්‍රීඩා තරඟ/කණ්ඩායම් ක්‍රීඩා සඳහා අවසර ඇත. සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව තරඟ නරඹන්නන් හා දිරි ගැන්වීම් අය හට අවසර නොමැත. |
| 5 | ළමා උද්‍යාන | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව |
| 6 | නවාතැන් ස්ථාන හා බෝඩින් නිවාස | අවසර ඇත.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව |
| 7 | Adventure Sites/Campaign Sites | විවෘතව ඇත.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව |
| 8 | ඔට්ටු ඇල්ලීමේ ස්ථාන | විවෘතයි.<br>සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව |
| 9 | සංගීත සංදර්ශන (ශාලාවන් තුල) | අවසර ඇත.<br>ශාලා අසුන්/ශාලා ධාරිතාවයෙන් 50% සීමාවට යටත්ව. |
| 10 | සැණකෙළි/ සංගීත සංදර්ශන (එළිමහන්) | අවසර නැත. |

**6.** ඉහත දැක්වූ පරිදි සංචරණ සීමා ලිහිල් කිරීම් සිදු කලද යම් ප්‍රදේශයන් එම කාල සීමාව තුල <u>හුදකලාභාවයට පත්කර තිබෙන්නේ නම්</u> සංචරණ සීමා ලිහිල් කිරීම් එම ප්‍රදේශ වෙත වලංගු වන්නේ නැත.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**වෛද්‍ය අසේල ගුණවර්ධන**
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**